

2022

කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

விழிப்புலனற்ற நபர்களின் நம்பிக்கை நிதியம்

Rehabilitation of the Visually Handicapped Trust Fund





2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

වැය ශීර්ෂය - 216-2-3-3-3-1508

සමාජ සේවා දෙපාර්තමේන්තුව
දෙවන මහල
සෙත්සිරිපාය - II අදියර
බත්තරමුල්ල

දුරකතනය - 0112187050
ෆැක්ස් - 0112186276
ඊ මේල් - TrustFund20SSD@gmail.com

2022 වර්ෂයේ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ කළමනාකරණ මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය

01. පූජ්‍ය ගලබොඩ ඥානීස්සර ස්වාමීන් වහන්සේ	- යාවජීව සාමාජික
02. සුනේත්‍රා ගුණවර්ධන මහත්මිය	- සභාපති - දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල
	ලේකම් - ප්‍රාථමික සෞඛ්‍ය සේවා,වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු අමාත්‍යාංශය
නීල් බණ්ඩාර හපුහින්න මහතා	- සභාපති - දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල
	ලේකම් - කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්යාංශය
03. චන්දන රණවීර ආරච්චි මහතා	- සමාජ සේවා අධ්‍යක්ෂ
අනෝජා හේරත් මහත්මිය	- සමාජ සේවා අධ්‍යක්ෂ
04. ටී.එන්.අමෝන් මහතා	- සහකාර ලේකම් - අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
එන්.වයි.කොහොවල මෙනවිය	- ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
05.වමීර පුබුදු කුමාර මහතා	- සභාපති - ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය
06. ආර්.එම් පි.එච්. ගුණරත්න මහතා	- සහකාර ලේකම්- ශ්‍රී ලංකා අන්ධ ජන සේවා මණ්ඩලය
07.කමල්සිරි නානායක්කාර මහතා	- සභාපති- ශ්‍රී ලංකා ජාතික දෘශ්‍යාබාධිත සම්මේලනය
08. කෞෂල්‍ය රාජපක්ෂ මහතා	- සිංහ සමාජ නියෝජිත - දිස්ත්‍රික් 306 B2 සිංහ සමාජය

නිරීක්ෂක

සුගත් වසන්ත ද සිල්වා	- සභාපති - ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත උපාධිධාරී මණ්ඩලය

නිලධාරී මණ්ඩලය

01. ඊ.ඒ.වයි.එදිරිසිංහ මහතා	- ලේකම් -දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල
02. ජේ.එල්.අතුකෝරාළ මෙනවිය	- භාණ්ඩාගාරික -දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල
03. ජී. දිනූෂා සන්දීපනී මෙනවිය	- කළමනාකාර සහකාර නිලධාරී
04. කේ.ඩබ්.ආර්.ඉරේෂා මහත්මිය	- කළමනාකාර සහකාර නිලධාරී

පටුන

පරිච්ඡේදය 01 - අරමුදලේ පැතිකඩ

1.1 - හැදින්වීම
1.2.නෛතික පසුබිම
1.3.පරමාර්ථ
1.4.ආයතනයේ දැක්ම , මෙහෙවර
1.5.අරමුදලේ ප්‍රධාන කාර්යයන්
1.6.සංවිධාන සටහන

පරිච්ඡේදය 02

2.1.දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - මූල්‍ය ප්‍රගතිය
2.2.භෞතික කාර්ය සාධන දත්ත
2.3.පනතේ පරමාර්ථ හා අනුගත වීම
2.4.තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
2.5.විශේෂ ජයග්‍රහණ

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 01

ආයතනනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ වෙසෙන ආබාධිත ප්‍රජාව අතරින් එක් විශේෂිත කණ්ඩායමකි දෘශ්‍යාබාධිත ප්‍රජාව .ඔවුන් ශාරීරිකව මෙන්ම බුද්ධියෙන් සාමාන්‍ය පුද්ගලයින් හා සමාන වෙයි.වර්තමානයේ ඔවුන්ගේ ආදායම් ඉපයීමේ ක්‍රියාවලිය කෙසේ වුව ද අතීතයේ ඔවුන් රට තුළ වෙසෙන සාමාන්‍ය ප්‍රජාව මෙන් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ ක්‍රියාවලිය සඳහා විවිධ කර්මාන්තවල යෙදෙමින් ,විවිධ රැකියාවල නිරත වෙමින් කාර්යක්ෂමව කටයුතු කළ පිරිසකි.විශේෂයෙන්ම දේශීය අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තයේ නිරත වෙමින් ඔවුන් ජාතික නිෂ්පාදනයට විශේෂ දායකත්වයක් සපයන ලදි.

1977 වර්ෂයේ හඳුන්වාදුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හේතුවෙන් දෘශ්‍යාබාධිත ප්‍රජාවට තමන් සතුව පැවති ස්වාධීන ආර්ථික උත්පාදන ක්‍රියාවලියට විවිධ බාධා ඇතිවිය.විශේෂයෙන්ම තමන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමේ ක්‍රියාවලිය ක්‍රමයෙන් බිඳවැටෙන්නට විය.තරහකාරීත්වය හමුවේ මෙම තත්ත්වයට මුහුණ දීමට තම ආබාධය ඔවුනට විශේෂ අපහසුතාවයක් විය.

මේ අනුව තමන් මුහුණ දුන් අපහසුතාවයන්ගෙන් යම් තරමක හෝ සහනයක් ලබා ගැනීමේ අරමුනෙන් ඔවුන් පෙළ ගැසුන අතර තමන් මුහුන දුන් මෙම අපහසුතා පිළිබඳව එවකට පැවති රජයේ අවධානය සඳහා යොමු කිරීමට කටයුතු කරන ලදි.එහි ප්‍රතිඵලයක් ලෙස දෘශ්‍යාබාධිත ප්‍රජාව සඳහා සහන සැලසීමේ සහ ඔවුන්ගේ සුභසාධනය සැලසීමේ අරමුනෙන් 1992 අංක 9 දරන දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල නමින් පාර්ලිමේන්තු පනතක් සම්මත කරගෙන එහි අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වීම සඳහා දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල පිහිටුවන ලදි.

ආරම්භයේ පටන්ම මෙහි කාර්යාලය සමාජ සේවා දෙපාර්තමේන්තුව තුළ පිහිටුවා සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන සම්පත් භාවිත කරමින් ක්‍රියාත්මක වේ.වර්තමානය වන විට මෙම අරමුදල සඳහා වාර්ෂික අයවැය ලේඛනය මගින් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ 216 යටතේ රු.මිලියන 9 ක් වෙන් වන අතර පවත්නා ප්‍රතිපාදන හමුවේ රට තුළ ජීවත්වන දෘශ්‍යාබාධිත ප්‍රජාව වෙනුවෙන් උපරිම සෙවයක් සැලසීම සඳහා අරමුදලේ සාමාජිකයින් සහ සාමාජික සංවිධාන එක්ව කටයුතු කරනු ලබයි. මෙම කාර්ය සාධන වාර්තාව මගින් අරමුදල වර්තමානයේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් , ව්‍යාපෘති පිළිබඳව 2022 වර්ෂයට අදාළව සමස්ත කාර්ය සාධනය ඉදිරිපත් කෙරේ.

1.2.නෛතික පසුබිම

1992 අංක 9 දරණ දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල පනත දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලක් පිහිටුවීම සඳහා ද, එහි පරමාර්ථ හා බලතල නිශ්චය කොට දැක්වීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ අනුශාංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි. වර්තමානයේ මෙම අරමුදල කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ඇති සමාජ සේවා දෙපාර්තමේන්තුව තුළ ස්ථාපනය කොට ඇත.

1.3.පරමාර්ථ

පනතේ 5 ඡේදය අනුව එහි පරමාර්ථ පහත සඳහන් පරිදි වේ.

(අ) දෘශ්‍යාබාධිතයන් සඳහා අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණු පහසුකම් සැපයීම

(ආ) දෘශ්‍යාබාධිතයින් සඳහා සේවා නියුක්ති අවස්ථා ඇති කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හීදී ඔවුන්ට ස්වයංරැකියා සඳහා මූල්‍යාධාර සහ මාර්ග දේශකත්වය සැපයීම

(ඇ) දෘශ්‍යාබාධිතයන්ට ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබා ගැනීමට හැකිවනු පිණිස ඔවුන්ට නිවාස පහසුකම් සැපයීම

(ඈ) දෘශ්‍යාබාධිතයන්ගේ සුභසාධනය පිණිස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම

(ඉ) දෘශ්‍යාබාධිතයන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීම සහ

(ඊ) සමාන අයිතිවාසිකම් සහ සමාන අවස්ථා ලබා ගැනීමෙන් දෘශ්‍යාබාධිත තැනැත්තන් වලක්වාලන තත්ත්වයන් නැති කිරීමට ක්‍රියා කිරීම

1.4.ආයතනයේ දැක්ම , මෙහෙවර

දැක්ම

දෘශ්‍යාබාධිත තැනැත්තන් සඳහා අභිමානයෙන් යුත් ස්වාධීන ජීවිතයක්

මෙහෙවර

දෘශ්‍යාබාධිත තැනැත්තන් සඳහා සමානත්වය හා සමාන සහභාගීත්වය ලබාදීම සඳහා අවශ්‍ය සහය ලබාදීම මෙන්ම දෘශ්‍යාබාධිත තත්වයට පත්වන පුද්ගලයින් එයින් මුදවා ගැනීමට කටයුතු යෙදීම , පුනරුත්ථාපනය , ඔවුන් විෂයෙහි සුභසාධනය සැලසීම

1.5.අරමුදලේ ප්‍රධාන කාර්යයන්

1.ක්‍රීඩා ආධාර ලබා දීම

* දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා හෝ දෘශ්‍යාබාධිත පුද්ගල සංවිධාන සඳහා හෝ දෘශ්‍යාබාධිත සිසුන් අධ්‍යාපනය ලබන විශේෂ පාසැල් සඳහා ක්‍රීඩා ආධාර ලබා දීම

2.අධ්‍යාපන හා සංස්කෘතික ආධාර ලබා දීම

* දෘශ්‍යාබාධිත පාසැල් සිසුන් ,දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සහ දෘශ්‍යාබාධිත දෙමාපියන්ගේ දෘශ්‍යාබාධිත නොවන දරුවන් සඳහා ශිෂ්‍යාධාර ආධාර ලබා දීම

* බ්‍රේල් මාධ්‍යයෙන් නිකුත් කරනු ලබන මාසික සඟරාව (කාලය) සඳහා ආධාර ලබා දීම

3.පුනරුත්ථාපන ආධාර ලබා දීම

* පසුකාලීනව දෘශ්‍යාබාධිතභාවයට පත් පුද්ගලයින් පුනරුත්ථාපනය කොට සමාජගත කිරීමේ වැඩසටහන

* සාමාන්‍ය අකුරින් මුද්‍රිත පොත් කථන ග්‍රන්ථ බවට පත් කිරීමේ කථන පුස්තක සැකසීමේ වැඩසටහන


4. දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්වීම වැලැක්වීමේ අරමුණින් වයස අවුරුදු 60 ට අඩු පුද්ගලයින් සඳහා අක්ෂි කාව හා අක්ෂි ප්‍රතිකාර සඳහා ආධාර ලබා දීම

5.ජාත්‍යන්තර සුදු සැරයටි සුරක්ෂා දින සැමරුම් ජාතික වැඩසටහන පැවැත්වීම

6. විශේෂ ඉල්ලීම්වලට අනුව වෘත්තීය පුහුණු ආයතනවල සහ දෘශ්‍යාබාධිත සිසුන් අධ්‍යාපනය ලබන පාසැල්වල උපදේශකවරුන් සඳහා (තාවකාලික) දීමනා ලබා දීම

7.දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ නිවාස සඳහා විදුලිබලය සහ පානීය ජලය සපයා ගැනීම සඳහා ආධාර ලබා දීම

1.6.සංවිධාන සටහන


සභාපති
ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
සමාජ සේවා අධ්‍යක්ෂ
අග්‍රාමාත්‍ය ලේකම් හෝ නියෝජිත
සිංහ සමාජ නියෝජිත
ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය
ලේකම්
සභාපති
ශ්‍රී ලංකා අන්ධ ජන සේවා මණ්ඩල නියෝජිත
ශ්‍රී ලංකා ජාතික දෘශ්‍යාබාධිත සම්මේලන නියෝජිත
ලේකම්
භාණ්ඩාගාරික
කළමනාකරණ සහකාර නිලධාරී
කළමනාකරණ සහකාර නිලධාරී

පරිච්ඡේදය 02

2.1.දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - මූල්‍ය ප්‍රගතිය

වැය ශීර්ෂය 216- 02-03-3-1508 2022/12/31 දිනට

අනු අංකය	වැඩසටහන හා ප්‍රගතිය	ඇස්තමේන්තුව රු.	වියදම් රු.
01	ක්‍රීඩා ආධාර	35,000.00	30,000.00
02	වෘත්තීය පුහුණු හා උපදේශක දීමනා	300,000.00	235,000.00
03	පුනරුත්ථාපන ආධාර	1,373,000.00	1,000,457.00
04	අධ්‍යාපන හා සංස්කෘතික ආධාර	5,133,540.00	5,279,586.00
05	ජාත්‍යන්තර සුදු සැරයටි දින සැමරුම් ජාතික උත්සවය	1,070,110.00	1,070,110.00
06	අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර	100,000.00	17,500.00
07	විගණන ගාස්තු	138,000.00	138,000.00
08	පරිපාලන වියදම්	815,350.00	833,438.49
09	මූල්‍ය වියදම්	10,000.00	4,758.65
10	විවිධ වියදම්	24,500.00	23,869.00

2.2.භෞතික කාර්ය සාධන දත්ත

විස්තරය	2022 වර්ෂය අවසානයට
1.පවත්වන ලද කළමනාකරණ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව	08
2.අනුමත කාර්ය මණ්ඩලය	-
(අ) සත්‍ය කාර්ය මණ්ඩලය - ස්ථිර වැටුප් ලබන	01
(ආ)1992 අංක 9 දරණ දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල පනතේ ලබා දී ඇති බලතල අනුව අරමුදලේ කටයුතු කිරීම සඳහා දීමනාවක් ලබා දීමේ පදනම මත සේවය කරනු ලබන සංඛ්‍යාව	03
1. ක්‍රීඩා ආධාර - දෘශ්‍යාබාධිත සිසුන් අධ්‍යාපනය ලබන විශේෂ පාසැල් 12 ක් සඳහා වෙස් බෝඩ් ලබා දීම	12
2.අධ්‍යාපන හා සංස්කෘතික ආධාර	
i. 1 වසර සිට අ.පො.ස. (සා.පෙළ) දක්වා දෘශ්‍යාබාධිත සිසුන් සඳහා ශිෂ්‍යාධාර	101
ii. අ.පො.ස.(උ.පෙළ) දක්වා දෘශ්‍යාබාධිත සිසුන් සඳහා ශිෂ්‍යාධාර	24
iii.විශ්වවිද්‍යාල දෘශ්‍යාබාධිත සිසුන් සඳහා ශිෂ්‍යාධාර	51
Iv. දෘශ්‍යාබාධිත දෙමාපියන්ගේ දෘශ්‍යාබාධිත නොවන දරුවන් සඳහා ශිෂ්‍යාධාර	213
v. බ්‍රේල් මාධ්‍යයෙන් නිකුත් කරනු ලබන මාසික සඟරාව (කාලය සඟරාව) කලාප	12
3. වෘත්තීය පුහුණු උපදේශක දීමනා ගෙවීම -උපදේශක වරුන්	05
4.පුනරුත්ථාපන ආධාර	

ශ්‍රී ලංකා අන්ධ ජන සේවා මණ්ඩලය මගින් පවත්වනු ලබන පසුකාලීනව දෘශ්‍යාබාධිත බවට පත්වූවන් සඳහා පවත්වනු ලබන පුනරුත්ථාපන වැඩසටහන i. උපදේශකවරුන් ii. පුහුණුලාභීන් iii.කොවිඩ් වසංගතය හේතුවෙන් පවත්වාගෙන ගිය ස්වයංරැකියාව අත්හැර දැමූ හෝ ස්වයංරැකියාව පවත්වාගෙන යාමට බාධා ඇති වූ දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා ස්වයංරැකියා ආධාර ලබා දීම Iv.සාමාන්‍ය අකුරින් ලියැවුන පොත් කථන මාධ්‍ය පොත් බවට පත් කිරීමේ කථන පුස්තක ව්‍යාපෘතිය	 05 19 07 පිටු 18000
5. ජාත්‍යන්තර සුදු සැරයටි දින සැමරුම් ජාතික උත්සවය	01

2.3.පනතේ පරමාර්ථ හා අනුගත වීම

අනු අංකය	පරමාර්ථය	ක්‍රියාකාරකම
01	දෘශ්‍යාබාධිතයන් සඳහා අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණු පහසුකම් සැපයීම දෘශ්‍යාබාධිතයින්ගේ සුභසාධනය පිණිස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම	1 වසර සිට අ.පො.ස. (සා.පෙළ) දක්වා දෘශ්‍යාබාධිත සිසුන් සඳහා ශිෂ්‍යාධාර ii. අ.පො.ස.(උ.පෙළ) දක්වා දෘශ්‍යාබාධිත සිසුන් සඳහා ශිෂ්‍යාධාර iii.විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යාධාර Iv.දෘශ්‍යාබාධිත දෙමාපියන්ගේ දෘශ්‍යාබාධිත නොවන දරුවන් සඳහා ශිෂ්‍යාධාර v. බ්‍රේල් මාධ්‍යයෙන් නිකුත් කරනු ලබන මාසික සඟරාව(කාලය සඟරාව)
02	දෘශ්‍යාබාධිතයින් සඳහා සේවා නියුක්ති අවස්ථා ඇති කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හීදී ඔවුන්ට ස්වයංරැකියා සඳහා මූල්‍යාධාර සහ මාර්ග දේශකත්වය සැපයීම	ස්වයංරැකියා ආධාර ලබා දීම
03	දෘශ්‍යාබාධිතයන්ගේ සුභසාධනය පිණිස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම	අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර සඳහා ආධාර ලබා දීම පුනරුත්ථාපන ආධාර ලබාදීම (පසුකාලීනව දෘශ්‍යාබාධිත භාවයට පත්වූවන් පුනරුත්ථාපනය කොට සමාජ ගත කිරීම)
04	සමාන අයිතිවාසිකම් සහ සමාන අවස්ථා ලබා ගැනීමෙන් දෘශ්‍යාබාධිත තැනැත්තන් වලක්වාලන තත්ත්වයන් නැති කිරීමට ක්‍රියා කිරීම	කථන පුස්තක සැකසීම සඳහා ආධාර ලබා දීම ක්‍රීඩා ආධාර ලබා දීම

2.4.තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම ,අධ්‍යනයේ සියලුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම සහ ආබාධිත පුද්ගලයින්ට,ස්වදේශිකයින්ට සහ අවදානමට ලක්විය හැකි ළමුන්ට වෘත්තීය පුහුණුව ලබා ගැනීමට අවස්ථාව සැලසීම	පාසැල් අධ්‍යාපනය සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දෘශ්‍යාබාධිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ශිෂ්‍යාධාර මුදල් ලබා දීම	ශිෂ්‍යාධාර ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව			√
	දෘශ්‍යාබාධිත දෙමාපියන්ගේ පාසැල් අධ්‍යාපනය ලබන දෘශ්‍යාබාධිත නොවන දරුවන් සඳහා ශිෂ්‍යාධාර මුදල් ලබා දීම	ශිෂ්‍යාධාර ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව			√
	විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දෘශ්‍යාබාධිත උපාධි අපේක්ෂකයින් සඳහා තාක්ෂණික උපකරණ ලබා දීම(ජංගම දුරකථන)	තාක්ෂණික උපකරණ ලබාගත් උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව			√
	දෘශ්‍යාබාධිත සිසුන් අධ්‍යාපනය ලබන විශේෂ පාසැල් සඳහා ක්‍රීඩා ආධාර ලබා දීම	ක්‍රීඩා ආධාර ලබා දුන් පාසැල් සංඛ්‍යාව		√	
2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබාදීම	දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා ස්වයංරැකියා ආධාර ලබා දීම	ස්වයංරැකියා ආධාර ලබාගත් පුද්ගල සංඛ්‍යාව	√		

2030 වන විට වයස,ලිංගිකත්වය,ආබාධිතබව,ජන වර්ගය ,ජාතිය,ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්ත්වයන් පිළිබඳව තැකීමකින් තොරව සියලු දෙනාගේ සමාජ,ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම	පසුකාලීනව දෘශ්‍යාබාධිතභාවයට පත් වූ පුද්ගලයින් පුනරුත්ථාපනය කර සමාජගත කිරීමේ වැඩසටහන් සඳහා අධාර ලබා දීම	පුනරුත්ථාපන වැඩසටහන සඳහා සහභාගී වූ පුද්ගල සංඛ්‍යාව			√
	දෘශයාබාධිත පුද්ගලයින්ගේ කියවීමේ අයිතිය තහවුරු කිරීම සඳහා බ්‍රේල් මාධ්‍යයෙන් මාසිකව නිකුත් කරනු ලබන කාලය සහරාව සඳහා ආධාර ලබා දීම සාමාන්‍ය මුද්‍රිත අකුරින් නිෂ්පාදිත ග්‍රන්ථ, කථන ග්‍රන්ථ බවට පත්කර ශ්‍රවණය කිරීම මගින් කියවීමේ අයිතිය තහවුරු කිරීම සඳහා කථන පුස්තක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආධාර ලබා දීම	නිකුත් කරනු ලබන සහරා වාරික ප්‍රමාණය			√
		කථන පිටු බවට පත්කළ මුද්‍රිත පිටු සංඛ්‍යාව		√	
	දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ සංචාරක මෙවලම වන සුදු සැරයටිය පදනම් කර ගනිමින් ජාත්‍යන්තර සුදු සැරයටි සුරක්ෂා දින සැමරුම් ජාතික උත්සවය	උත්සවය සඳහා සහභාගී වූ දෘශ්‍යාබාධිත පුද්ගල සංඛ්‍යාව		√	

2.5.විශේෂ ජයග්‍රහණ

• වෙන් කළ සීමිත ප්‍රතිපාදන හමුවේ දෘශ්‍යාබාධිත පුද්ගලයින් 400 ක පමණ සහභාගීත්වයෙන් සුදු සැරයටි දින සැමරුම් ජාතික උත්සවය පැවැත්වීම

අභියෝග

- දෘශ්‍යාබාධිත ප්‍රජාව සඳහා සේවා සැපයීම පුළුල් කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම
- පැවති ප්‍රවාහන සහ ආර්ථික අභියෝග හමුවේ පුනරුත්ථාපන වැඩසටහන සඳහා සේවාලාභීන් සහභාගී කර ගැනීමේ අභියෝගය

ඉලක්ක

- දිවයින තුළ වෙසෙන සමස්ත දෘශ්‍යාබාධිත ප්‍රජාව ඇතුළත් වන පරිදි දත්ත පද්ධතියක් සකස් කිරීම
- දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා තාක්ෂණික උපකරණ ලබා දීම
- මුද්‍රිත ග්‍රන්ථ 100 ක් කථන ග්‍රන්ථ බවට පත් කිරීම
- දෘශ්‍යාබාධිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර ගෘහස්ථ ක්‍රීඩා ප්‍රවර්ධනය කිරීම

සභාපති

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

නම - යමුනා පෙරේරා

තනතුර - සභාපති

යමුනා පෙරේරා
ලේකම්
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
05 වන මහල, සෙත්සිරිපාය - අදියර II බත්තරමුල්ල.

දිනය 2023/06/27

පරිච්ඡේදය 03

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

	සටහන	2022	2021
		රු	රු
මෙහෙයුම් ආදායම			
රජයේ ප්‍රදාන		9,000,000.00	9,000,000.00
වෙනත් ලැබීම්	01	183,656.26	101,696.60
		9,183,656.26	**9,101,696.60**
මෙහෙයුම් වියදම්			
ක්‍රීඩා ආධාර		30,000.00	12,000.00
වෘත්තීය පුහුණු වියදම්		220,000.00	199,000.00
අධ්‍යාපන හා සංස්කෘතික ආධාර		4,979,586.00	6,726,555.00
පුනරුත්ථාපන ආධාර		980,232.00	1,242,186.50
පරිපාලන වියදම්		799,729.12	494,725.50
අක්ෂි කාච හා ප්‍රතිකාර		17,500.00	46,950.00
විගණන ගාස්තු		138,000.00	78,000.00
මූල්‍ය වියදම්		4,758.65	250.00
විවිධ වියදම්		23,869.00	26,980.00
සුදු සැරයටි දින වියදම්		1,031,410.00	
		8,225,084.77	**8,826,647.00**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/හිඟය		958,571.49	275,049.60

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන්	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
සාමාන්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ අතිරික්තය/හිඟය		**958,571.49**	**275,049.60**
ජංගම වගකීම්වල වැඩිවීම			
වෘත්තීය පුහුණු වියදම්			47,000.00
සුදු සැරයටි දින වියදම්			
අධ්‍යාපන හා සංස්කෘතික ආධාර වියදම්		186,900.00	
පුනරුත්ථාපන ආධාර වියදම්			57,875.00
ජංගම වගකීම්වල අඩුවීම			
පුනරුත්ථාපන වියදම්		(20,225.00)	
අධ්‍යාපන හා සංස්කෘතික ආධාර වියදම්			(287,000.00)
වෘත්තීය පුහුණු		(15,000.00)	
විගණන ගාස්තු			(78,000.00)
මූල්‍ය වියදම්			(6,580.00)
හඳුනානොගත් ලැබීම්			(600.00)
ජංගම වත්කම්වල වැඩිවීම			-
ස්ථාවර තැන්පත්		**(2,166,290.63)**	
ජංගම වත්කම්වල අඩුවීම			-
නිමි තොගය		-	9,671.40
ලාභයට පසුගිය වසරෙන් ගලපන ලද මුදල		-	(380,400.00)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(1,056,044.14)**	**(362,984.00)**
වර්ෂ මුල මුදල් හා මුදල්වලට සමාන දෑ		**3,032,019.75**	**3,395,003.75**
වර්ෂ අවසාන මුදල් හා මුදල්වලට සමාන දෑ		**1,975,975.61**	**3,032,019.75**

2022 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2022 රු	2021 රු.
වත්කම්			
ජංගම වත්කම්			
ස්ථාවර තැන්පතු		2,166,290.63	-
බැංකු ශේෂය		1,975,975.61	3,032,019.75
අවසන් තොගය - අමු ද්‍රව්‍ය		48,250.00	48,250.00
නිමි තොගය			
මුළු වත්කම්		**4,190,516.24**	**3,080,269.75**
වගකීම්			
-			
උපචිත වියදම්	02	1,045,675.00	894,000.00
මුළු වගකීම්		**1,045,675.00**	**894,000.00**
මුළු ශුද්ධ වත්කම්		**3,144,841.24**	**2,186,269.75**
නිමිකම			
-			
සමුච්චිත අරමුදල		2,186,269.75	1,911,220.15
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය		958,571.49	275,049.60
මුළු ශුද්ධ නිමිකම		**3,144,841.24**	**2,186,269.75**

භාණ්ඩාගාරික

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන හාර අරමුදල

J. L. Athukorala
Accountant
Department of Social Services
2nd Floor, II Step
"Sethsiripaya" Battaramulla

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්ඩබ්/සී/විඑවිවිඑස්/එෆ්එස්/2022/01

මගින් සඳහන් කළ අංකය / நமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 මැයි 31 දින

සභාපති,

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා පරිචයන්ට පටහැනිව ගනුදෙනු පිටපත් කිරීමේදී අපැහැදිලි හා විධිමත් නොවන ලෙස ප්‍රධාන ලෙජරය හා ගිණුම් පොත් පවත්වා තිබූ අතර ගනුදෙනු වලට අදාල වවුචර් අංක, චෙක්පත් අංක යනාදී විස්තර මකා දමා වෙනස් කිරීම් සිදුකර විනිවිදභාවයකින් තොරව මුදල් පොත සහ වියදම් ලේඛන පවත්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව උපචිත පදනම මත ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලට අදාලව රු. 52,362 ක්වූ පොලී අදායම ගිණුම් ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය

කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදලට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අරමුදලේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) අරමුදල සඳහා රජයේ ප්‍රතිපාදන වලට අමතරව , දේශීයව හෝ විදේශ වලින් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග, උපලබ්ධි හෝ එකතු කරන මුදල් සහ අරමුදලේ ආයෝජනවලින් ලැබෙන ආදායම හෝ අරමුදලට අයවිය යුතු හෝ වෙනත් මුදල් මඟින් අරමුදල් සම්පාදනය කර ගැනීමට 1992 අංක 09 දරණ දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ හාර අරමුදල් පනතේ 7 වගන්තිය පරිදි නෛතික ප්‍රතිපාදන සලසා නිබුණු නමුත් අරමුදල ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂ 29 ක කාලපරිච්ඡේදය තුල අරමුදල වර්ධනය කරගැනීම වෙනුවෙන් රජයේ ප්‍රදාන වලට අමතරව අනෙකුත් අරමුදල් ප්‍රභවයන් කෙරෙහි අවධානය යොමුකර හෝ ඒ සඳහා ඉදිරි සැලැස්මක් හෝ අරමුදල සතුව නොතිබුණි.

(ආ) දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට සුභසාධනය සැලසීම වෙනුවෙන් මහාභාරකාර දෙපාර්තමේන්තුව තුල ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතින පුද්ගල අරමුදල් භාර හා දේපල භාරයන් වල ප්‍රතිලාභ ගෙවීම් පිළිබඳව පසුවිපරම් කටයුතු කර එකී ප්‍රතිලාභ අරමුදලට ලබාගැනීම තුලින් වෙනත් ලැබීම් ප්‍රභවයන්ගෙන් අරමුදල් සම්පාදනය කරගැනීම කෙරෙහි ද අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) අරමුදලේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් වූ

- දෘශ්‍යාබාධිතයින් උදෙසා සේවා නියුක්ති අවස්ථා ඇති කිරීම.
- දෘශ්‍යාබාධිතයින්ට ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීම හෝ වෘත්තීය පුහුණුව ලබාගැනීමට හැකිවනු පිණිස නිවාස පහසුකම් සැපයීම.
- දෘශ්‍යාබාධිතයින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීම.
- සමාන අයිතිවාසිකම් හා සමාන අවස්ථා ලබාගැනීමෙන් වළක්වාලන තත්ත්වයන් නැතිකිරීම යනාදී කාර්යයන් සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම්කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලසම්මට අනුව අක්ෂි කාච/ අක්ෂි ප්‍රතිකාර සැපයීම ප්‍රතිලාභීන් 05 ක් ඉලක්ක ගත කර තිබුණ ද එක් ප්‍රතිලාභියෙකු සඳහා පමනක් ක්‍රියාත්මක වී තිබුණි.

(ඉ) පළමු වසරේ සිට අ.පො.ස.(සා.පෙළ) දක්වා ඉගෙනුම ලබන දරුවන්, උසස් පෙළ හදාරන දරුවන්, විශ්ව විද්‍යාලීය දරුවන් සහ ලුවී බ්‍රේල් නමින් දෘශ්‍යාබාධිත දෙමව්පියන්ගේ දෘශ්‍යාබාධිත නොවන දරුවන්ට අධ්‍යාපන ආධාර වශයෙන් ශිෂ්‍යාධාර ලබාදීම අරමුදල මඟින් සිදුකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ඉලක්ක ගත 401 දෙනෙකු ගෙන් සිසුන් 368 දෙනෙකුට ශිෂ්‍යාධාර ලබාදීම සඳහා රු.5,279,586 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකල නියදි පරීක්ෂාවේ දී පහත කරුනු නිරීකෂණය විය.

I. සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි දෘශ්‍යාබාධිත දරුවන් සංඛ්‍යාව හඳුනාගැනීමට අදාලව දත්ත පද්ධතියක් පවත්වා නොතිබුණි.

II. ශිෂ්‍යාධාර ලබාදීමට අදාලව ශිෂ්‍යයින් තෝරා ගැනීමේ පදනම, අවශ්‍ය සුදුසුකම්, ප්‍රමුඛතාවය ලබාදීම, ලබාදෙන ශිෂ්‍යාධාර වටිනාකම යනාදී නිර්ණායක ඇතුලත් ශිෂ්‍යාධාර ලබාදීමේ යෝජනා ක්‍රමයක් සැලසුම්කර ක්‍රියාත්මක කර නොතිබුණි.

III. ශිෂ්‍යාධාරලාභීන් තෝරාගත් ක්‍රමවේදය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම කටයුතු නිවැරදිව හා විනිවිදභාවයකින් යුතුව සිදු කර තිබුණේ ද යන්න විගණනයේදී ගැටළු සහගත විය.

IV. මාර්තු සහ අප්‍රේල් මස ශිෂ්‍යාධාරලාභීන් 158 දෙනෙකු වෙත රු 735,000 ක ශිෂ්‍යාධාර ලබා දී තිබූ අතර ශිෂ්‍යාධාරලාභීන් 115 දෙනකු ලබා ගත් රු 507,000 මුදල සනාථ කිරීම සඳහා ලදුපත් අරමුදල වෙත ලබා දී නොතිබුණි. ඒ අනුව ශිෂ්‍යාධාර ලබාදීමේ ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර පාලනය දුර්වල තත්ත්වයක පවතින බව විගණනයට නිරීක්ෂණය විය.

(ඊ) විශ්ව විද්‍යාලයන්හි ඉගෙනුම ලබන දෘශ්‍යාබාධිත දරුවන්ට ශිෂ්‍යාධාර ලබාදීමේ කටයුතු ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත රාජ්‍ය විශ්ව විද්‍යාල 17 ක් අතුරින් විශ්ව විද්‍යාල 06 කට පමණක් සීමා කර තිබුණි.

(උ) දෘශ්‍යාබාධිත දක්ෂ දරුවන්ගේ ප්‍රාථමික අධ්‍යාපනය දිරිමත් කිරීමේ අරමුණින් පහ වසර ශිෂ්‍යත්වය සමත් දෘශ්‍යාබාධිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ශිෂ්‍යාධාර ලබාදීමේ වැඩපිලිවෙලක් කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

(ඌ) දෘශ්‍යාබාධිත ප්‍රජාවගේ පුනරුත්ථාපනය හා සුභසාධනය උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘති ජාති මට්ටමින් විනිවිදභාවකින් හා විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා දෘශ්‍යාබාධිත ප්‍රජාවගේ සංඛ්‍ය හා දිස්ත්‍රික්ක වශයෙන් ව්‍යාප්තිය,වයස් ව්‍යුහය, දෘශ්‍යාබාධිත තත්ත්වය, ආර්ථික තත්ත්වය ය තොරතුරු හඳුනාගැනීම වැදගත් වේ. ඒ තුලින් නිශ්චිත, නිවැරදි හා ඵලදායී තීරණ ගැනීම සඳ පහසුවක් වේ. නමුත් දෘශ්‍යාබාධිත ප්‍රජාවගේ එම තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙ කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 **වෙනත් විගණන නිරීක්ෂණ**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අරමුදල ස්ථාපිත කර වර්ෂ 29 ක කාලයක් ගතවී ඇතත් එම අරමුදලේ ලේකම් තනතුර සඳහා රාජකාරී ඉටුකරන සමාජ සේවා නිලධාරියෙකු හා රාජකාරී ඉටුකරන තවත් නිලධාරීන් තිදෙනෙකු විසින් අරමුදලේ කාර්ය භාරය ඉටු කර ගෙන යනු ලැබීය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති